බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024
(කලාප මට්ටමේ ලිඛිත තරග)

1. අපේක්ෂකයාගේ නම : ------------------------------------------------
(මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ------------------------------------------------
3. පාසල් වර්ගය (200 තෙක් / 201 - 500 තෙක් / 500 ට වැඩි) ------------------------
4. කලාපය : ------------------------
5. පළාත : ------------------------

9 ශ්‍රේණිය

**පද්‍ය නිර්මාණ හා අවබෝධය**

කාලය පැය 02

- පළමුවන කොටසට අයත් **සියලු ම ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීම සඳහා ලියන කඩදාසි භාවිත කරන්න.
- ඔබගේ පිළිතුරු පත්‍රය සමඟ ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

## I කොටස

(01) පහත දැක්වෙන රූපකාලංකාර යෙදුම් උපමාලංකාර බවට හරවන්න.

i. හද මිණි බැම්ම
ii. කරුණාව ගංගාවකි
iii. නැණ නැවින්
iv. සිප් සයුර
v. කෙලෙස් මල
vi. සාහිත්‍ය මල් උයන
vii. වත කමල
viii. ජීවන ගඟ
ix. කෝප ගින්න
x. ශ්‍රී පාද පද්මය

(ලකුණු 1 X 10 = 10)

(02) පහත දී ඇති පද්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. හිරු රැස් නාමින් නෙලුම් පිපිලා
පොකුණු හිනා වෙනවා
මැයි ගස නන්සිරි පුන්සිරි රුසිරින්
මනමාලිය වෙනවා
බඳු වද කිණිහිරි ඉද්ද සමන් මල්
තරගෙට පිබිදෙනවා
මල් මල් මල් මල් දෙගොඩ තලා මල්
ගඟක් ගලා යනවා

මෙහි දැක්වෙන මල්වල නම් ලියන්න.

................................................................................................

ii. රැක් අත්තන මල මුදුනේ
බඹරු නටන හැන්දෑවේ
සැදෑ අඳුර පියමං කර
කවුරුද එන්නේ, පුතුනි බලන්
යොමා නුවන්

දී ඇති පද්‍ය ඛණ්ඩයේ සඳහන්වන ක්‍රියාකාරකමක් ලියන්න.

................................................................................................

iii. <u>පෙම්මා</u> සුරතල් කියමින් දෙතනේ කිරි          බොම්මා
වම්මා කඳුලැලි ඉස හිස ඇවිදින් දැයි          අම්මා
අම්මා අප නොදැක ඉතිං කෙලෙසක          <u>වැවෙම්මා</u>
සම්මා සම්බුදු වෙන දා නිවන් දකින්          අම්මා

යටින් ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

iv. පියාසර කර ආමි - දේශයෙන් දේශයට
මගේ රට මට අගෙයි - තව්තිසාවට වැඩිය
සුමුදු මුදු වලාවෙන් - මිදෙන දළදා මැඳුර
ඇසට එක රසඳුනයි - දසුන රන් කොත උදුල

මෙහි දැක්වෙන පරිදි ඇසට රසඳුනක් වන්නේ කුමක් ද?

v. ජාතිය රන් විමනක්          වේ
ආගම මිණි පහනක්          වේ
එය රැක ගන්නට          මෙලොවේ
සමත් වෙතොත් පුත          නුඹවේ

දී ඇති පද්‍යයේ ඇති රූපක දෙකක් ලියන්න.

(ලකුණු 2 X 5 = 10)

(03) පද පූරණය කොට ලියන්න.

i. පොතේ සුවඳ බල          බලා
.......................................................................
.......................................................................
අකුරට යමි සිත          ලොලා

ii. සුදු පෙණ පිඬු දහරා මුතු කැට          මෙනි
.......................................................................
මැණික් ඉසින්නා ලෙස දිය          විසිරුණි
.......................................................................

iii. රිකිලි සලසලා හෙළනා වනයෙ          අසිරියයි
.......................................................................
.......................................................................
කුරුලු නදින් පරිසරයෙම මිහිරි          නාදයයි

iv. .......................................................................
.......................................................................
මහමග          අනතුරු
සිදුවෙයි          නිරතුරු

v. සැමවිට සතුටයි මට ගෙන          දෙන්නේ
නිවසේ සැම වෙත සිත          යොදවන්නේ
.......................................................................
.......................................................................

(ලකුණු 2 X 5 = 10)

(04) පහත සඳහන් කවි පැනවලට අදාළ විරිතෙන් ම පිළිතුරු ලියන්න.

i. ඈත ඈත දුරක ඉඳන් කඳුරු හිමවුවේ
සැඟව ගොසින් සීත සීත වැහි හිම බිඳුවේ
පාවීලා සතුටු සිතින් ඉගි බිගි පෑවේ
දේදුන්නේ කොහොමද ඔබ ඔතනට ආවේ?

ii. පාසල වෙත එන යන විට
අපගේ පොඩි බස් රිය කට
ලියා කුරුටු බලි සැම විට
කරන්නෙ ඇයි ඒ විලසට?

iii. නුඹේ ගෙදර අඹ ගසේ
ලේන් කුඩුවක් දිසේ
පැටවෙකු හඬනවා ඇසේ
පූසි ඇයි ද ඒ දෙසේ!

iv. අපේ කුඹුරෙ හෙට ගොයම් කපනවා
ඉපනැල්ලේ දුව පැන පැන යනවා
මුළු දවසෙම අපි වැඩෙහි යෙදෙනවා
ඔබ එනවද? මම බලා ඉන්නවා

v. සම්පත් ඇති තරම් මගෙ රට තියෙන්නේ
බෙදිලා යාමෙ වරදක් මට පෙනෙන්නේ
එනිසා වරද අප කාට ද කියන්නේ
ඇයි මිනිසුන් අද සිඟමන් යදින්නේ?

(ලකුණු 2 X 5 = 10)

(05) පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කොට ඔබේ සිතේ මැවෙන සංකල්පනා පද්‍යයට නගන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. සඳැස් නම් පද්‍ය 6 - 8 ක් විය යුතු ය. නිසඳැස් නම් පේළි 25 - 30 ක් අතර විය යුතු ය.



(ලකුණු 10)

## II කොටස

(01) (අ) කොටසින් හෝ (ආ) කොටසින් කැමති **එක් ප්‍රශ්නයක් තෝරා ගෙන** කාව්‍ය නිර්මාණයක් කරන්න.

- සඳැස් පද්‍ය පන්තියක් නම් කවි 6 - 8 ක් විය යුතු ය.
- නිසඳැස් පද්‍ය පන්තියක් නම් පේළි 25 - 30ක් අතර විය යුතු ය.

**(අ) කොටස**

(අ) i.

පාසල වෙත දිව එමී
අකුරට මැලි නොම වෙමී
සෙල්ලමටත් ගත වෙමී
මම හොඳ ළමයෙක් වෙමී (මාතෘකාව - මම හොඳ ළමයෙක්)

ii.

කඳු හෙල් මුදුනින් පැන නැංගා
වන විල් තුරු අතරි න් රිංගා
බීමට සුදුසුයි ජල ගංගා
සුරකිමු සුරකිමු ඒ ගංගා (මාතෘකාව - ගංගාවක් ගලා බසියි)

(ලකුණු 50)

**(ආ) කොටස**

(ආ) i. මව සමග වෙළෙඳ පොළට ගිය ඔබට දැනුණ හැඟීම කවියට නගන්න.

ii. ඔබ සැමරූ උපන්දින උත්සවය ගැන විස්තර කරමින් මිතුරෙකුට/ මිතුරියකට යවන කවි ලිපිය ලියන්න.

(ලකුණු 50)